Journalists for Democracy in Sri Lanka

මාධ්‍ය නිවේදනය

2009 ජුලි 22

**ශ්‍රී ලංකාව - වත්මන් ආණ්ඩුවේ පස් වසර තුළ මාධ්‍යකරුවන් 34 දෙනෙකු ඝාතනය කෙරේ**

ජයග්‍රහණය ලබා යුද්ධය අවසන් කළ බව ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ප්‍රකාශ කිරීමෙන් පසු ද ජනමාධ්‍යවේදීනට එරෙහිව එල්ලවන බිය ගැන්වීම් සහ තර්ජන ගර්ජන බියකරු ලෙස වර්ධනය වීම *ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජනමාධ්‍යවේදියෝ* සංවිධානයේ බලවත් සැළකිල්ලට ලක්වෙයි. වත්මන් ශ්‍රී ලංකාවෙහි ජනතාවගේ තොරතුරු දැන ගැනීමේ අයිතිය අහෝසි කර ඇති අතර ජනමාධ්‍යයට සහ ජනමාධ්‍යවේදින්ට පෙර නොවූ විරූ මට්ටමේ ස්වයං වාරණයක් පවත්වා ගෙන යාමට බල කෙරී තිබේ.

මෙම සන්දර්භය තුළ වත්මන් ආණ්ඩුව යටතේ ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය සේවකයින් 34 දෙනෙකු ඝාතනයට ලක්ව ඇති බව අප සංවිධානය වාර්තා කරන්නේ කෝපයෙන් සහ කණගාටුවෙන් යුතුව ය. මෙලෙස ඝාතනය වූ ජනමාධ්‍යවේදීන් අතුරින් සිංහල තිදෙනෙකු සහ මුස්ලිම් එක් අයකු හැරුණ විට අන් 30 දෙනාම අයත්වන්නේ දෙමළ ප්‍රජාවට ය. ඝාතනය කරන ලද ජනමාධ්‍යවේදීන්ගේ සම්පූර්ණ ලැයිස්තුව මේ සමඟ අමුණා ඇත. මීට අමතරව ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍යසේවකයින් 10 දෙනෙකු පැහැර ගෙන යන ලදී. වසරකට වැඩි කාලයකට පෙර අත් අඩංගුවට ගනු ලැබූ මාධ්‍යවේදී ජයප්‍රකාශ් තිස්සනායගම්ද, ඔහුගේ මුද්‍රණකරු වෙට්ට්‍රිවේල් ජසීහරන් සහ ජසීහරන්ගේ බිරිඳ වඩිවේල් වලර්මදී තවදුරටත් සිරභාරයේ රඳවාගෙන සිටියි. මෙම ඝාතනයන් සහ පැහැර ගැනීම් ශ්‍රී ලංකාවේ පවත්නා වරදට දඬුවම් නොකර සිටීමේ සංස්කෘතිය මනාව පෙන්වාලයි.

වත්මන් එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව 2004 අප්‍රේල් මාසයේ දී බලයට පැමිණියේ වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂ අගමැති වශයෙන් ඇතිව ය. මෙතරම් කෙටි කාලයක් තුළ මේ සා මාධ්‍ය වෘත්තිකයින් පිරිසක් ඝාතනය වූ අන් වකවානුවක් ශ්‍රී ලංකා ඉතිහාසයේ නොමැත. මෙම කාල පරිච්ඡේදය තුළ ජන මාධ්‍ය වෘත්තිකයින්ට එරෙහි බිය ගැන්වීම් සහ තර්ජන අතෝරක් නැතිව වර්ධනය විය. මෙම තත්ත්වය යටතේ වධ හිංසාවන්ට ලක්වීමෙන් බේරීම පිණිස 50 දෙනෙකුට වැඩි ජනමාධ්‍යවේදීන් පිරිසක් විදේශ ගත වී තිබේ: ඔස්ට්‍රියාව 01, ඕස්ට්‍රේලියාව 03, කැනඩාව 03, ඩෙන්මාර්කය 01, ප්‍රංශය 12, ජර්මනිය 04, ඉන්දියාව 05, මලයාසියාව 01, නෙදර්ලන්තය 02, නේපාලය 02, නොර්වේ 02, ස්විස්ටර්ලන්තය 16, බ්‍රිතාන්‍ය 10, ඇමෙරිකාව 02.

*ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජනමාධ්‍යවේදියෝ* සංවිධානය ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය නිදහස මුහුණ දී සිටින භයානක තත්ත්වයෙන් මුදවා ගැනීම පිණිස අන්තර්ජාතික ජන මාධ්‍ය දූත කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද කරුණු 11 සැළැස්මට සම්පූර්ණ සහයෝගය පළකරයි. ඒ සමඟම ශ්‍රී ලංකාවේ සියළුම ජනතාවන්ගේ මානව සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් දිනා ගැනීම පිණිස රටෙහි සහ ඉන් පිටත ක්‍රියාකාරී සියළු ප්‍රජාතන්ත්‍රවාදී බලවේග සමඟ එක්ව ක්‍රියාකරන බවට ශපථ කරයි.

ශ්‍රී ලංකාවේ පවත්නා වරදට දඬුවම් නොකර සිටීමේ සංස්කෘතිය අහෝසි කර මෙකී අපරාධයන්ට වගකිවයුතු පිරිස් නීතිය හමුවට පමුණුවන සේ ජනාධිපති රාජපක්ෂ ආණ්ඩුවට බලකරන ලෙස *ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජනමාධ්‍යවේදියෝ* එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන්, සියළු ආණ්ඩුවලින් සහ අන්තර් ජාතික සංවිධාන වෙතින් ඉල්ලා සිටී.

සිය රටෙහි දී වධ හිංසාවන්ට පමුණුවනු ලැබීමෙන් ගැලවීම පිණිස රටින් බැහැර වූ ජන මාධ්‍යවේදීන්, ලේඛකයින්, කලාකරුවන් සහ මානව හිමිකම් ආරක්ෂකයින් එක්ව ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්තත්‍රවාදය, මානව හිමිකම් සහ මාධ්‍ය නිදහස උදෙසා ක්‍රියාකිරීම පිණිස යුරෝපයේ දී එක්රැස්ව *ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ජනමාධ්‍යවේදීහු* සංවිධානය පිහිටුවා ගැණුනි.

**විධායක කමිටුව**
**ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා මාධ්‍යවේදියෝ**

C/O INSD, Kremmener Strasse 2, 10435 Berlin, Germany / journalistsfordemocracy@gmail.com

Journalists for Democracy in Sri Lanka

## 2004 අප්‍රේල් සිට 2009 මාර්තු දක්වා ඝාතනයට ලක් වූ ජනමාධ්‍ය වෘත්තිකයින්ගේ ලැයිස්තුව

**2004**

1. අයියතුරෛ නඩේසන් - ජනමාධ්‍යවේදී / 31 මැයි
2. කන්දසාමි බාලනඩරාජ් - ලේඛක / අගෝස්තු 16
3. ලංකා ජයසුන්දර - ඡායාරූප මාධ්‍යවේදී / දෙසැම්බර් 11

**2005**

4. ධර්මරත්නම් සිවරාම් - සංස්කාරක / අප්‍රේල් 28
5. කන්නමුත්තු අර්සකුමාර් - මාධ්‍ය සේවක / ජූනි 29
6. රේලංගි සෙල්වරාජ් - ජනමාධ්‍යවේදිනී / අගෝස්තු 12
7. ඩී. සෙල්වරත්නම් - මාධ්‍ය සේවක / අගෝස්තු 29
8. යෝගකුමාර් ක්‍රිශ්ණපිල්ලෙ - මාධ්‍ය සේවක / සැප්තැම්බර් 30
9. එල්.එම්.ෆලීල් (නට්පිට්ටිමුනෛ ෆලීල්) - ලේඛක / දෙසැම්බර් 02
10. කේ.නවරත්නම් - මාධ්‍ය සේවක/ දෙසැම්බර් 22

**2006**

11. සුබ්‍රමානියම් සුගීර්දරාජන් - ජනමාධ්‍යවේදී / ජනවාරි 24
12. එස්.ටී. ගනනාදන් - මාධ්‍ය ප්‍රධානී / පෙබරවාරි 01
13. බැස්ටියන් ජෝර්ජ් සගයදාස් - මාධ්‍ය සේවක/ මැයි 03
14. රාජරත්නම් රන්ජිත්කුමාර් - මාධ්‍ය සේවක / මැයි 03
15. සම්පත් ලක්මාල් ඩි සිල්වා - ජනමාධ්‍යවේදී / ජූලි 02
16. මරියදාසන් මනෝජන්රාජ් - මාධ්‍ය සේවක / අගෝස්තු 01
17. පත්මනාදන් විශ්මනාදන් - ගායන ශිල්පී සහ සංගීතඥ / අගෝස්තු 02
18. සතාසිවම් බාස්කරන් - මාධ්‍ය සේවක / අගෝස්තු 15
19. සින්නතම්බි සිවමහරාජා - මාධ්‍ය හිමිකරු / අගෝස්තු 20

**2007**

20. එස්.රවීන්ද්‍රන් - මාධ්‍ය සේවක / පෙබරවාරි 12
21. සුබ්‍රමානියම් රාමචන්ද්‍රන් - ජනමාධ්‍යවේදී / පෙබරවාරි 15
22. චන්ද්‍රබෝස් සුදාකර් - ජනමාධ්‍යවේදී / අප්‍රේල් 16
23. සෙල්වරාසා රජීවර්මන් - ජනමාධ්‍යවේදී / අප්‍රේල් 29
24. සහදේවන් නිලක්ෂන් - ජනමාධ්‍යවේදී / අගෝස්තු 01
25. අන්තෝනිපිල්ලෙ සෙරින් සිත්තිරාජන් - මාධ්‍ය සේවක / නොවැම්බර් 05
26. වඩිවේල් නිමලරාජා - මාධ්‍ය සේවක / නොවැම්බර් 17
27. ඉසෙයිවිලි චෙම්පියන් (සුභාජිනී) - මාධ්‍ය සේවිකා / නොවැම්බර් 27
28. සුරේෂ් ලිම්බියෝ - මාධ්‍ය සේවක / නොවැම්බර් 27
29. ටී. ධර්මලිංගම් මාධ්‍ය සේවක / නොවැම්බර් 27

**2008**

30. පරනිරූපසිංහම් දේවකුමාර් - ජනමාධ්‍යවේදී / මැයි 28
31. රශ්මි මොහොමඩ් - ජනමාධ්‍යවේදී / ඔක්තෝබර් 06

**2009**

32. ලසන්ත වික්‍රමතුංග - සංස්කාරක / ජනවාරි 08
33. පුන්නියමූර්ති සත්තියමූර්ති - ජනමාධ්‍යවේදී / පෙබරවාරි 12
34. සසී මදන් - මාධ්‍ය සේවක / මාර්තු 06

C/O INSD, Kremmener Strasse 2, 10435 Berlin, Germany / journalistsfordemocracy@gmail.com